www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*නික් බීම්ස් 70 වන සංවත්සර රැස්වීම අමතයි*

# ධනවාදී බිඳවැටීම සහ හතර වන ජාත්‍යන්තරයේ විප්ලවවාදී ඉදිරිදර්ශනය

*2 වන කොටස*

**Nick Beams addresses 70th anniversary meeting**
**Capitalist breakdown and the revolutionary perspective of the Fourth International**
**Part 2**

**නික් බිමස් විසිනි**
**2008 ඔක්තෝබර් 6**

*පහත පලවන්නේ හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ 70 වන සංවත්සරය වෙනුවෙන් සැප්තැම්බර් 28 දා සිඩ්නි නුවර පැවති ප්‍රසිද්ධ රැස්වීමකට නික් බීම්ස් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක දෙවන කොටසයි. බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු මෙන් ම ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ද වේ. ලෝක සමාජවාදී වෙබ් අඩවිය බීම්ස්ගේ වාර්තාව කොටස් හතරකින් පල කරනු ඇත.*

ගෝලීය මූල්‍ය අර්බුදය දිගහැරෙත්ම, නව වාක්‍යාංශයක් වැඩෙන තාරතාවකින් යුක්තව අපට අසන්ට ලැබී ඇතඃ එනම්, ලාභ පුද්ගලීකරනය සහ පාඩු සමාජකරනය යි. මෙය වනාහි, සිදු වෙමින් පවතින දෙය පිලිබඳ හුදු සංක්ෂිප්ත සාරාංශකරනයක් නොවේ. එය වඩා පුලුල් ලෙස පෙන්නුම් කරන්නේ එලඹෙන කාල පරිච්ජේදයේ දී පොර බැඳීමට යන අති මූලික දේශපාලන ප්‍රශ්න ය.

මේ ප්‍රශ්නය ක්ෂනිකව පැන නගීඃ සමාජයේ ආර්ථික ප්‍රතිසංවිධානය සිදු කිරීමට යන්නේ කාගේ අවශ්‍යතාව මත ද? මූල්‍ය පද්ධතියේ මෙහෙයුම්වලින් වාසි ලබන සුපිරි ධනවත් ඉතා තුනී සුලුතරය ගලවා ගනු වස් සමාජයේ සම්පත් යෙදවිය යුත්තේ ඇයි?

පාඩු සමාජකරනය කෙරෙන්නේ නම් -- එහි වියදම සමස්තයක් ලෙස සමාජය විසින් දරන්ට යන්නේ නම් -- ලාභ ද සමාජකරනය නොකරන්නේ මන් ද? එය වෙනත් ආකාරයකින් කිය තොත්, සමස්තයක් ලෙස සමාජයේ අවශ්‍යතා වෙනුවෙන් පාලනය හා සංවිධානය කෙරෙනු පිනිස සමස්ත බැංකු හා මූල්‍ය පද්ධතිය ම පොදු අයිතිය යටතට නොගත යුත්තේ ඇයි?

දැවැන්ත ඇප දීමේ මෙහෙයුම යුක්තියුක්ත කරනු සඳහා ඉදිරිපත් කෙරෙන කාරනාව නම්, එය නොකල හොත් සත්තකින්ම පෙර නොවූ විරූ පරිමානයකින් යුක්ත ආර්ථික කඩාවැටීමක් සිදු වනු ඇති බව යි. නිදසුනක් ලෙස, කෝටිපති ආයෝජක වැරන් බෆට් "ඇමරිකානු ඉතිහාසයේ විශාලතම මූල්‍ය දියවීම" පිලිබඳව අනතුරු ඇඟවී ය.

එබැවින්, මෙය ඇත්තෙන් ම සුපිරි ධනවතුන් ඇප දී ගලවා ගැනීමක් නොව, සමස්තයක් ලෙස මහජනතාවගේ ආර්ථික අවශ්‍යතා සුරක්ෂිත කර ගැනීමක් යයි තර්ක කරනු ලැබේ.

*වෝල් ස්ට්‍රීට් ජර්නල්* හි පල වූ ලිපියක් මූල්‍ය පද්ධතියේ වටිනාමක් නැති වත්කම් ආන්ඩුව විසින් මිලදී ගනු ලැබීමේ පිලිවෙත ඉදිරියට තල්ලු කිරීමේ තීන්දුව ගත් සැප්තැම්බර් 17 වන බදාදා සිද්ධිය මෙසේ විස්තර කලේ ය.

"ඉහල පෙලේ උපදේශකයන් සමග බදාදා සිය කාර්යාලයේ රහස් සාකච්ඡාවක් පවත්වමින් සිටි, භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන්, වෙලඳ පොලවල් එකකට පසුව තවෙකක් වසයෙන් වියවුලට ඇද වැටෙද්දී, සිය මූල්‍ය දත්ත තිරය දෙස නෙත් යොමා ගෙන සිටියේ ය. අයෝජකයෝ දිගු කලක් තිස්සේ අති-සුරක්ෂිත ලෙස සැලකුනු මූල්‍ය-වෙලඳ පොල අන්‍යෝන්‍ය අරමුදල් හැර යමින් සිටිති. බැංකු සිය දිනපතා ව්‍යාපාරික කටයුතුවලට මුදල් සපයාගනු වස් රඳා පවතින කෙටි කාලීන නය, වෙලඳ පොල විසින් අත්හිටුවනු ලැබ ඇත. එවන් යාන්ත්‍රන නොමැතිව ආර්ථිකය ඇනහිටීමක් කරා යා හැකි ය. ඉක්මනින් ම, පාරිභෝගිකයෝ කලබලයට පත් වනු ඇත." (*වෝල් ස්ට්‍රීට් ජර්නල්* 2008 සැප්තැම්බර් 20).

සැප්තැම්බර් 18 වන බ්‍රහස්පතින්දා වන විට මූල්‍යමය දියවීමක් සිදු වෙමින් පැවතුනි.

එහෙත් මෙය මතු කරන්නේ ද අප වඩාත් තියුනු ආකාරයකින් ඉදිරිපත් කල ප්‍රශ්නය ම ය. වත්මන් ආර්ථික පර්යාය සමග ඉදිරියට යා හැක්කේ තව කොතෙක්

කලකට ද? ධනවාදී වෙලඳ පොල හා ක්ෂමා විරහිත ලෙස ලාභ පිටුපස හඹා යාම මත පදනම් වන්නා වූ ද එහි මෙහෙයුම් එක්සත් ජනපදයේ ජනතාව හා ලොව පුරා කම්කරු පන්තිය මත ආර්ථික ව්‍යසනයන් කඩාපාත් කිරීමේ තර්ජනය මතු කරන්නා වූ ද සමාජ හා ආර්ථික පද්ධතියකට අවසන් තිත තැබීමට කාලය එළඹ ඇති බව නිසැක ය.

ව්‍යසනයක් වලකාලනු වස් පවත්නා සියලු ම සම්පත් බලමුලු ගැන්වීම අවශ්‍ය නම්, එවිට නිසැකව ම දෙගුනයකින් අවශ්‍ය කාරනාව නම්, පලමු කොටම ව්‍යසනය නිර්මානය කල අයගේ අත්වලින් මෙම සම්පත් ඉවත් කොට ඒවා නිර්මානය කිරීමට ශ්‍රමය -- මානසික හා ශාරීරික -- වැය කර ඇති කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතට ඒවා පත් කිරීම යි.

එක්සත් ජනපදයේ මූල්‍ය අර්බුදය, පසුගිය දශක තුනක කාලය මුලුල්ලේ ධනපති පන්තිය සඳහා එතරම් කේන්ද්‍රීය දෘෂ්ටිවාදාත්මක ක්‍රියාකලාපයක් ඉටු කර ඇති වෙලඳ පොල පිලිබඳ මිථ්‍යාවන් හා මන්ත්‍ර නිසැකව ම බිඳ දමා ඇත.

සමාජ සේවාවන්, සෞඛ්‍යය, අධ්‍යාපනය හා පොදු කාර්ය ව්‍යුහය යන ක්ෂේත්‍රයන්හි වැඩි දියුනුවක් ද නවීන ජීවිතයේ සෙසු අවශ්‍යතා ද පිලිබඳව ඉල්ලීම් මතු කෙරී ඇති ඕනෑම අවස්ථාවක ප්‍රතිචාරය ලෙස ඉදිරිපත් කෙරී ඇත්තේ මේ හඬයි: විශාල රාජ්‍ය අංශය විසඳුම නොවේ. ඒවාට මුදල් විසි කිරීමෙන් ගැටලු විසඳිය නොහැක. එවන් අවශ්‍යතා සපුරාලනු වස් සම්පත් නොමැත. අනාගතය සඳහා එක ම ශක්‍ය ආර්ථික වැඩපිලිවෙල වන්නේ, අදාල සේවා සඳහා පාරිභෝගිකයාගෙන් මුදල් අයකිරීම මිස, සමාජ සේවා හා පහසුකම් නොමිලේ සැපයීම නොවේ.

මෙම හනමිටි කතා මුලුමනින් ම හා සත්තකින් ම කුඩු පට්ටම් කෙරී ඇති අතර ඒවා සේවය කරන්නේ කුමන පන්ති අවශ්‍යතාවන්ට ද යන වග එලිදරව් වී තිබේ. විශාල රාජ්‍ය අංශය? මූල්‍ය ධනපති තන්ත්‍රයේ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම ගැන සලකන තාක් කල්, සීමාව වන්නේ ආකාශය යි.

## එක්සත් ජනපද ධනවාදයේ ඓතිහාසික කඩාවැටීම

කෙසේ වෙතත්, අර්බුදය, පසුගිය දශක තුනක කාලයේ "නිදහස් වෙලඳ පොල" දේශපාලනයේ දෘෂ්ටිවාදාත්මක පදනම් බිඳ දැමීමට වඩා වැඩි යමක් කර තිබේ. දේශපාලන හා ආර්ථික කලබගැනිවලින් යුක්ත දශක හතරකට ආසන්න කාලයකට අනතුරුව, දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇති කෙරුනු ලෝක ධනවාදයේ යලි ස්ථායිකරනයේ පටන් මේ දක්වා ලෝක ධනවාදය වාරු වී සිටි ආර්ථික පදනම් බිඳවිසිරීමේ අතිශයින් ම වැඩිදියුනු අදියරක් කරා ලඟා වී ඇත යන කාරනාව අර්බුදය මගින් පැහැදිලි කරනු ලැබ ඇත.

අප සමස්තයක් ලෙස විසි වන සියවස, විශේෂයෙන් ම පසුගිය 60 වසරක කාලය, සමාලෝචනයට භාජන කල හොත්, පැහැදිලි වන්නේ, මේ දක්වා ම ධනවාදයේ පැවැත්ම තුල වූ ප්‍රධාන වෛෂයික සාධකය වී ඇත්තේ එක්සත් ජනපද ධනවාදයේ ශක්තිය බව යි.

අපගේ ව්‍යාපාරය, හතර වන ජාත්‍යන්තරය, ධනපති පාලක පන්තීන්ගේ බලය පවත්වා ගෙන යාමෙහි ලා කම්කරු පන්තියේ පැරනි නායකත්වයන් -- ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ලේබර් පක්ෂ සහ වෘත්තීය සමිති නායකත්වයන්, මධ්‍යම පන්තික රැඩිකල් කන්ඩායම්වල සිය ක්ෂමාලාපකයන් හා ආරක්ෂකයන් සමග එක්ව -- විසින් සිදු කරන ලද තීරනාත්මක දේශපාලන ක්‍රියාකලාපය, එලිදරව් කර තිබේ.

හතර වන ජාත්‍යන්තරයේ පාදක ලියවිල්ල ආරම්භ වන්නේ මෙලෙස යෑ "ලෝක තත්වය සමස්තයක් ලෙස ප්‍රධාන වසයෙන් ම ගුනාංගීකරනය කෙරෙන්නේ, නිර්ධන පන්තියේ නායකත්වයේ ඓතිහාසික අර්බුදයක් මගිනි. . . . නිර්ධන පන්තික විප්ලවය සඳහා වෛෂයික පූර්ව-අවශ්‍යතා" පරිනත වී තිබෙනවා පමනක් නොව, ඒවා තරමක් දුරට කුනු වෙන්නට ද පටන් ගෙන ඇත. ඊලග ඓතිහාසික කාල පරිච්ඡේදයේ දී සමාජවාදී විප්ලවයක් සිදු නොවුව හොත්, මනුෂ්‍ය වර්ගයාගේ සමස්ත සංස්කෘතිය ම විනාශ වීමේ තර්ජනය මතු වනු ඇත. දැන් අවස්ථාව ඇත්තේ නිර්ධන පන්තියට ය, එනම්, ප්‍රධාන වසයෙන් ම එහි විප්ලවවාදී පෙරටු බල ඇනියට ය. මනුෂ්‍ය වර්ගයාගේ ඓතිහාසික අර්බුදය විප්ලවවාදී නායකත්වයේ අර්බුදය බවට ලඝු කෙරී ඇත."

මෙම වචන මීට වසර 70කට ඉහත දී ඒවා ලියනු ලැබූ කාලයේ දී මෙන් ම අදට ද සත්‍ය ය. එහෙත් එතැන් පටන් මේ දක්වා ධනවාදයේ පැවැත්ම පැහැදිලි කරන්නේ කෙසේ ද? "ආත්මීය සාධකයේ" කාර්ය භාරය -- ඓතිහාසික ක්‍රියාදාමය තුල විප්ලවවාදී නායකත්වයේ කාර්ය භාරය -- පිලිබඳ වඩාත් ම ප්‍රගාඪ අවබෝධය මත අපගේ ව්‍යාපාරය පදනම් කෙරුනි. ධනවාදය සිය පන නල රැක ගෙන ඇත්තේ කම්කරු පන්තියේ නායකත්වයන්ගේ පාවාදීම් හේතු කොට ගෙන ම පමනක් බවට කිසිදු ගැටලුවක් නැත.

කෙසේ වෙතත්, අපි ඓතිහාසික ආත්මීයවාදීහු නොවෙමු. විප්ලවයන් සිදු කල හැකි වන්නේ සමහර නිශ්චිත වෛෂයික කොන්දේසි යටතේ පමනි. එම කොන්"දේසි නිර්මානය වන්නේ, ධනවාදයේ ඓතිහාසික වර්ධනය සහ එය තුල පවත්නා ප්‍රතිවිරෝධතා වැඩීම මගිනි.

දෙවන ලෝක යුද්ධයට පෙරාතුව හා අනතුරුව පැවති විප්ලවවාදී කලබගැනිවලින් පසුව, පශ්චාත් දෙවන ලෝක යුද කාලීනව ධනවාදයේ පැවැත්ම සහතික කල බලගතු වෛෂයික ක්‍රියාදාමයන් පැවති බවට කිසිදු ගැටලුවක් නැත. මෙම සාධක අතර ප්‍රධාන එක වී ඇත්තේ, පසුගිය දශක හයක කාලය තුල ගෝලීය ධනවාදී පර්යායේ ස්ථාවරත්වය සඳහා අත්‍යවශ්‍ය ආර්ථික පදනම සම්පාදනය කර ඇති එක්සත් ජනපද ධනවාදයේ ශක්තිය යි.

මෙම අර්බුදයට එතරම් දුර දිග යන හා විප්ලවවාදී ඇඟවුම් ඇත්තේ ඒ නිසයි: එය ඇඟවුම් කරන්නේ එක්සත් ජනපද ධනවාදයේ ඓතිහාසික කඩාවැටීම, පරිහානිය සහ බිඳවිසිරීම යි. එයින් අදහස් කෙරෙන්නේ හතර වන ජාත්‍යන්තරය සහ කම්කරු පන්තිය යන දෙගොල්ල ම සූදානම් විය යුතු නව විප්ලවවාදී යුගයක ආරම්භය යි.

ධනවාදී පර්යායේ දෘෂ්ටිමය ආරක්ෂකයෝ, මුලුමනින් ම පාහේ නෛසර්ගිකව, අර්ධ-සවිඥානකව, ඇමරිකානු ධනවාදයේ ක්‍රියාකලාපයේ අර්ථභාරය අවබෝධ කර ගනිති. මහා අවපාතයෙන් පසුව මේ දක්වා පැවති ගැඹුරුතම අර්බුදයට මුහුන දී සිටියා වුවත්, "ලෝකය නතර වී නැති" බවට ඔවුන් අවධාරනය කරන්නේ මේ නිසයි.

සැප්තැම්බර් 9 දා ඕස්ට්‍රේලියන් පුවත්පතේ පල කර ඇති, ලන්ඩනයේ *ටයිම්ස්* පත්‍රයේ සහකාර කර්තෘ සහ ප්‍රමුඛ ආර්ථික අටුවාකරුවකු වන ඇනටෝල් කැලෙට්ස්කිගේ මෑත ලිපියකට සැඳහුම් කරමින් මෙම කරුන විදහා දැක්වීමට මට ඉඩ දෙන්න. එය පල කෙරුනේ, ෆ්‍රෙඩී මැක් හා ෆැනී මේ යන එක්සත් ජනපද යෝධ උකස් ආයතන දෙක ඇප දී ගලවා ගැනීමේ ඩොලර් බිලියන 85 සැලසුම ප්‍රසිද්ධ වීමෙන් දින දෙක තුනකට පසුව ය.

කැලෙට්ස්කි සිය ලිපිය ඇරඹුවේ මෙලෙස ය: "එතකොට, සාමාන්‍යයෙන් සෑම ප්‍රධාන මූල්‍ය අර්බුදයක ම පහල අවස්ථාව සලකුනු කරන, සාමාන්‍යයෙන් යම් ආකාරයක ආන්ඩුවේ සහයෝගය සමග එකට යන, "මහ එක" ද දැවැන්ත-පරිමාන කැලඹීම ද මේ? පරිමාවේ අර්ථයෙන් ගත් කල, ඒ පිලිබඳ කිසිදු ප්‍රශ්නයක් නැත. ෆැනී මේ හා ෆ්‍රෙඩී මැක් ගලවා ගැනීම . . . ලෝකයේ ඕනෑම තැනක ඕනෑම මූල්‍ය වෙලඳ පොලක මීට පෙර සිදු කරන ලද ඕනෑම ආන්ඩුවේ මැදිහත්වීමකට වඩා 10 ගුනයකින් විශාල ය."

ඔහුගේ නිගමනය වූයේ මෙයයි: "එක්සත් ජනපද ආර්ථිකය හා මූල්‍ය පද්ධතිය යලි දෙපයින් සිටුවීමට මෙම වැඩපිලිවෙල ප්‍රමානවත් නොවේ නම්, කල හැකි අන් දෙයක් ගැන සිතා ගැනීම පවා අසීරු ය. එබැවින් මෙම වැඩපිලිවෙලට එරෙහිව ඔට්ටු අල්ලන ඕනෑම අයෙක්, එක්සත් ජනපද ආර්ථිකය ආපසු හැරවිය නොහැකි නොවැලැක්විය හැකි කඩා වැටීමක් කරා යාමට නියමිත බවට ඔට්ටු අල්ලයි. එවන් ඔට්ටු ඇල්ලීමක් අතීතයේ දී නිරතුරුව ම වැරදී ඇති අතර මේ වතාවේ දී ද යලිත් වරක් වැරදීමට ඉඩ ඇත. ඉරිදා සිදු වූ දෙය බොහෝ විට "මහ එක" විය. ඉතිං එක්සත් ජනපද ආර්ථිකයේ යලි ගොඩ ඒමක් දැන් සහතික ය."

ඉන් පසුව පැවති සති දෙකක කාලය තුල සිදු වූ දෙය සැලකිල්ලට ගත් කල, කැලෙට්ස්කි මහතාගේ සහතික වීම් ගැන කිව හැකි අවම දෙය නම් ඒවා තරමක් අපරිනත බව යි. ෆැනී-ෆ්‍රෙඩී ඇප දීම ඊට පෙර ඕනෑම තැනක සිදු කෙරුනු ඕනෑම දෙයකට වඩා 10 ගුනයක් විශාල නම්, එවිට වත්මන් මෙහෙයුම අඩු ගනනේ එමෙන් 90 වාරයක් විශාල ය.

මෙහි දී එතරම් වැදගත් වන්නේ, අනාවැකිය ම නොවේ. එය එතරම් ම වැරදුනේ ඇයි ද යන්න යි. කැලෙට්ස්කි මහතා ඇමරිකානු ධනවාදයේ හා එහි ගෝලීය අධිකාරිත්වයේ නිත්‍ය භාවය දෙන ලද දෙයක් ලෙස ගෙන තිබේ. වත්මන් ජනගහනයේ අති මහත් බහුතරයක, සත්තකින් ම, මෙම ග්‍රහ ලෝකය මත මෙතෙක් ජීවත් වී ඇති ජනතාවගේ සැලකිය යුතු අනුපාතයක, ජීවිත අන්තර්ගත කර ගන්නා කාල පරිච්ඡේදයක් වන පසුගිය 60 වසරක කාලයේ ආර්ථික හා දේශපාලන රාමුවට මෙය කෙතරම් ම කේන්ද්‍රීය වී තිබෙන්නේ ද කිය තොත්, එය හැර අන් දෙයක් ගැන සිතාගත නොහැකි තරම් ය. නිරතුරුව ම සිදු වන්නාක් මෙන්, චින්තනය වෛෂයික ඓතිහාසික ක්‍රියාදාමයට බොහෝ පිටුපසින් ගාටයි.

ඇමරිකානු ධනවාදයේ බිඳවැටීම -- එය සිදු විය හැක්කේ කෙසේ ද? කෙසේ වෙතත්, එය සිදු වෙමින් පවතී, එය ඇඟවුම් කරන්නේ නව ඓතිහාසික යුගයක ආරම්භය යි. එහි දී ආර්ථික හා දේශපාලන යන ක්ෂේත්‍ර දෙකෙහිම බොහෝ පැරනි හා නිත්‍ය යැයි පෙනී ගිය සංස්ථා සිතා ගත නොහැකි වෙනස්කම්වලට භාජන වීමට යයි. මෙය තුලින් නව දේශපාලන සබඳතා හා හැකියාවන් පැන නගිනු ඇත.

## නික්සන් සහ බ්‍රෙට්න් වුඩ්ස්

අප කැලෙට්ස්කි මහතා සහ ඔහුගේ සහෝදර පන්ඩිතයන් අතහැර දැමීමට ප්‍රථමයෙන්, අප මෙම කාරනාව කරා අවතීර්න වී ඇත්තේ කෙසේ ද යන්න පැහැදිලි කරනු වස්, ඔහුගේ අදහස් තරමක් දුරට වගවිභාග කිරීම අවශ්‍ය ය. එක්සත් ජනපදයේ කඩාවැටීම පිලිබඳ මොන යම් හෝ ඔට්ටු ඇල්ලීමක් අතීතයේ දී වැරදුනු අතර දැන් ද වරදිනු ඇතැයි කැලෙට්ස්කි කියාපායි.

මහා අවපාතයෙන් පටන් ගෙන, අපි මෙම ප්‍රශ්නය ඓතිහාසිකව පරීක්ෂා කරමු. එය ජය ගනු ලැබුවේ කෙසේ ද? රූස්වෙල්ට්ගේ එක්සත් ජනපද ආන්ඩුවේ ක්‍රියාකාරකම් සහ 1930 ගනන්වල එහි නිව් ඩීල් (නව පිලිවෙත) මගින් නොවේ. රූස්වෙල්ට් ක්‍රියාවට දැමූ පිලිවෙත් අසාර්ථක වූ අතර 1937-38 වන විට ඇමරිකානු ධනවාදය 1932 බිඳවැටීමේ දී එය මුහුන දුන් තරම් ම ශීඝ්‍රයෙන් පසුබැස්මක් තුලට ගමන් කලේ ය.

නිව් ඩීල් පිලිවෙත්වල බිඳවැටීම ඇමරිකානු දේශපාලන ප්‍රභූවේ ප්‍රධාන කොටස් එක්තරා දුර දිග යන නිගමන කරා මෙහෙයවී ය. මෙම අර්බුදය ජයගැනීමේ එකම මග ලෝක ආර්ථිකය යලි සැකසීම ය යන අවබෝධය කරා, 1930 ගනන් අග වන විට, ඔවුන් පැමින තිබුනි.

ලෝක ආර්ථිකයේ පුනර්ජීවනය ද එක්සත් ජනපද හා ලෝක ධනවාදයේ ප්‍රසාරනය උදෙසා එතරම් ම අත්‍යවශ්‍ය වන, ප්‍රාග්ධනයේ හා භාන්ඩවල නිදහස් ගලනය ද සඳහා කොන්දේසි නිර්මානය කරනු වස් පැරනි බෙදීම්, පැරනි අධිරාජ්‍ය හා සන්ධාන බිඳ දැමිය යුතු විය. අති මූලික ම අර්ථයෙන් ගත් කල, එක්සත් ජනපදය යුද වැදුනේ, එම වැඩපිලිවෙල මත ය. 1934 දී ලියොන් ට්‍රොට්ස්කි පැහැදිලි කර තිබූ පරිදි: " එක්සත් ජනපද ධනවාදය මුහුන දී සිටින්නේ 1914 දී ජර්මනිය යුද්ධයේ මාවතට තල්ලු කල ගැටලුවලට ම ය. ලෝකය බෙදී ඇත? එය යලි බෙදිය යුතු ය. ජර්මනිය සඳහා එය යුරෝපය "සංවිධානය කිරීම" පිලිබඳ ගැටලුවක් විය. එක්සත් ජනපදය ලෝකය ම "සංවිධානය" කල යුතු යි.

යුද්ධයෙන් පසුව, ඉතාලියේ හා ප්‍රන්සයේ ධනපති ආන්ඩුවලට කොමියුනිස්ට් පක්ෂ එක්වූ යුරෝපය තුල ස්ටැලින්වාදයේ පාවාදීම්, එක්සත් ජනපදයට සිය ආධිපත්‍යය තහවුරු කොට ලෝක ධනවාදය නව පදනම් මත ප්‍රතිසංවිධානය කිරීම සඳහා කොන්දේසි නිර්මානය කලේ ය. 1944 බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම, නව ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියක් තහවුරු කොට ලෝක වෙලඳමේ ප්‍රසාරනයක් සඳහා පදනම දැමී ය. 1947 මාර්ෂල් සැලසුම යුරෝපීය ආර්ථිකයන් ප්‍රතිනිර්මානය කොට, වඩා කාර්යක්ෂම ඇමරිකානු පිරිද්දුම් පේලි නිෂ්පාදන පද්ධති යුරෝපය තුල වර්ධනය කරනු වස් පදනම් දැමී ය. මෙම පිලිවෙත්, ඒකාබද්ධව, පශ්චාත්-යුද කාලීන ධනවාදී ආර්ථිකයේ වර්ධනය උදෙසා පදනම් තහවුරු කලේ ය.

එක්සත් ජනපදයේ ආධිපත්‍යය යටතේ සිදු වූ මෙම පශ්චාත්-යුද කාලීන ප්‍රතිව්‍යුහගතකරනය, නව ධනවාදී නැග්මක් සඳහා මාවත විවෘත කලේ ය. ස්වර්නමය යුගයක් උදා වී ඇති බවක් පෙනී ගියේ ය. මහා අවපාතයේ පාඩම් ඉගෙන ගෙන ඇතැයි ධනේශ්වරයේ දෘෂ්ටිවාදීන් ප්‍රකාශ කල අතර සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ලේබර් දේශපාලනඥයන් මෙන් ම වෘත්තීය සමිති නිලධරයෝ ද එය ප්‍රතිරාවය කලහ. ධනපති ක්‍රමය නියාමනය කල හැකි බවට ඔවුහු අවධාරනය කලහ. විනාශය ගැන කියන මාක්ස්වාදී අනාවැකිකරුවන් වැරදි බව ඔප්පු වී තිබුනි: එනම්, සමනය කල නොහැකි ප්‍රතිවිරෝධතා හේතු කොට ගෙන ධනවාදයේ බිඳවැටීමක් කොහෙත්ම සිදු වී නැත.

කෙසේ වෙතත්, ඉතිහාසය, එවන් ප්‍රතිවිරෝධතා පැවතුනු බවත්, සත්තකින් ම පවතින බවත් ඒවා ජයගෙන නැති බවත් ඉක්මනින් ම පෙන්නුම් කිරීමට නියමිත විය. 1960 ගනන්වල වර්ධනය වීමට පටන් ගත් වැඩි වන ආර්ථික කලබගැනි තුල ඒවා ප්‍රකාශයට පත් විය. එම දශකයේ අවසානය වන විට, එක්සත් ජනපදය වැඩෙන ගෙවුම් ශේෂ හිගයක් පවත්නා ගෙන ගිය අතර 1971 දී, පලමු වන ලෝක යුද්ධයට පෙරාතු කාලයට පසුව ප්‍රථම වතාවට, එය වෙලඳ හිගයකට මුහුන දුන්නේ ය.

බ්‍රෙට්න් වුඩ්ස් මූල්‍ය පද්ධතිය යටතේ, ලෝකයේ ප්‍රධාන විනිමය ඒකකවල වටිනාකම් එක්සත් ජනපද ඩොලරයට සම්බන්ධිතව ස්ථාවර අගයන්හි තබන ලද අතර අවුන්සයක් ඩොලර් 35කට මාරු කල හැකි වන පරිදි රත්‍රන් මගින් ඩොලරයට පෙරලා පිටුබලය සපයන ලදි. එහෙත් 1970 ගනන්වල ආරම්භය වන විට, ලෝකයේ සෙසු ප්‍රදේශවල සංසරනය වන ඩොලර් ප්‍රමානය, එක්සත් ජනපදයේ රන් සංචිතයට වඩා බෙහෙවින් වැඩි විය. ජාත්‍යන්තර වෙලඳමේ ප්‍රසාරනය ම, එම ප්‍රසාරනය පදනම් කෙරුනු මූල්‍ය පද්ධතියට වල කපා තිබුනි.

බ්‍රෙට්න් වුඩ්ස් පද්ධතිය රැක ගැනීමේ ක්‍රියාමාර්ගයට එක්සත් ජනපදයේ එතෙර වියදම්, එනම් ආයෝජන හා මිලිටරි යන අංශ දෙකේ ම වියදම්, අඩු කිරීමක් ද රට තුල මන්දාවධමනකාරී කොන්දේසි ක්‍රියාවට දැමීමක් ද අවශ්‍ය කෙරුනි. ඒ අවස්ථාවේ වියට්නාමයේ යුද වියදම් එහි ඉහල ම මට්ටමේ පැවතුනි. එහෙත් එක්සත් ජනපද පාලනාධිකාරය ඉන් එකක් වත් සිදු කිරීමට සූදානම්ව සිටියේ නැත. අනෙක් විකල්පය වූයේ, එක්සත් ජනපදයේ සාපේක්ෂ ආර්ථික බලය අඩු වී පැවතීමත් ජපානයේ හා යුරෝපයේ යලි නැගීමත් පිලිගත් නව ජාත්‍යන්තර මූල්‍ය සබඳතා පද්ධතියක් නිර්මානය කිරීම යි. එය ද බැහැර කෙරුනි.

නික්සන් පාලනාධිකාරය, එක්සත් ජනපදයේ ප්‍රමුඛතාව රැක ගැනීමේ එල්ලයෙන් යුක්ත, වෙනත් මාවතක් ගත්තේ ය. 1971 අගෝස්තුවේ දී, එය එක්සත් ජනපද ඩොලරයේ රන් පිටුබලය ඉවත් කලේ ය. 1973 දී ස්ථාවර විනිමය සබඳතා පද්ධතිය අහෝසි කරන ලද අතර, ඊලග වසරේ දී, මූල්‍ය ප්‍රාග්ධනයේ ජාත්‍යන්තර සංචලනය නියාමනය කරනු වස් සකසා තිබූ යාන්ත්‍රන ද අහෝසි කෙරුනි.

**මතු සම්බන්ධයි.**



© www.wsws.org